දැරණියගල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ රු. 2,800,000 ක උසාවි දඩ ආදායම් බිල් කිරීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.140,000 ක දිරි දීමනා සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාල මුද්දර ගාස්තු ආදායම් වෙනුවෙන් ගෙවිය යුතු සටහන් පත්‍ර ගාස්තු සඳහා හා වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2011 හා 2012 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 02 ක රඳවුම් මුදල වූ රු.39,072 ක මුදල ආපසු ගෙවා තිබියදීත් පොදු තැන්පත් යටතේ දැක්වීම නිසා වර්ෂයේ බැරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලය තුළ ජලපාරිභෝගිකයන් විසින් ජල සැපයුම් ලබා ගැනීම සඳහා තැන්පත් කළ රු. 2,305,983 කමුදල ජල සැපයුම ලබාදීමේ කටයුතු සඳහා වැයකර තිබියදී පොදු තැන්පත් යටතේ දැක්වීම හේතුවෙන් පොදු තැන්පත් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ලද පරිගණක 02 ක යූපීඑස් 02 ක් හා බහුවිධ මොඩියුල යන්ත්‍රයක වටිනාකම ගණනය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල වටිනාකම අඩුවෙන් ගිණුම් මඟින් දක්වා තිබුණි.

(ඊ) සභා මාර්ග ඉදිකිරීම් කර්මාන්ත සඳහා ප්‍රාග්ධනවැය යටතේ මිලදී ගන්නා ලද හියුම් පයිප්ප වලින් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි තොග වටිනාකම වු රු.611,464 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ස්ථාවර වත්කම් අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සැපයුම් හා උපකරණ වියදම් , වියදම් පාලන හා ණයහිමි පාලන ගිණුම් මඟින් ගැලපීම් නොකර වැය ශීර්ෂයටම ඍජුව හර කරමින් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ලිපිගොනු රාක්ක මිලදී ගැනීම සඳහා දරන ලද රු.15,800 ක මුදල පුනරාවර්තන වැය විෂයක් වූ ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් පුනරාවර්තන වියදම වැඩියෙන් හා ප්‍රාග්ධන වියදම අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සභාව සතු අක්කර 01 රූඩ්03 පර්චස් 30 ක් වූ ඉඩම් කොටස් 03 ක වටිනාකම ගණනය කර ගිණුමගත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) ස්ථාවර තැන්පත් ගිණුම් 03 කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ලැබිය යුතු පොලිය රු.166,336 ක් වුවත් එය රු.248,966 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.82,630 ක් අඩුවෙන් හා 2015 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) පළාත් පාලන මාර්ග සංවර්ධන හා ගම නැගුම වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද කර්මාන්ත 07 කට අදාල 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් හා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර වල වටිනාකම රු.358,252 ක් වුවත් එය රු.597,946 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ගෙවිය යුතු ප්‍රාග්ධණ වියදම් හා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර වල වටිනාකම රු.239,694 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

------------------------------

ගිණුම් විෂයයන් දෙකකට අදාලව මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.4,312,081 ක් හා උපයෝගී ලේඛන/ වාර්තා අනුව ශේෂය රු.1,925,192 ක් වූයෙන් නොසැසඳුන වෙනස රු.2,386,889 ක් විය .

ගිණුම අනුව පොදු තැන්පත් වටිනාකම රු.7,342,014 ක් වුවත් පොදු තැන්පත් ලේඛනය තුලනය කර නොතිබීම හේතුවෙන් එහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) 2015 දෙසැම්බර් 31 ට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.47,655,242 ක් වූ අතර එයින් රු.29,564,596 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 ට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.37,216,560 ක් වූ අතර එයින් රු.1,399,332 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය

1.3.4 නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය | වරිපනම් දේපල 10 කින් රු.94,946 ක් හා අක්කර බදු රු.158,980 ක ශේෂයක් අයකර ගැනීමට අදාලව යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.371(5) | රු.60,687 ක අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය | සේවකයන් 09 දෙනෙකුගෙන් 2006 වසරේ සිට අයවිය යුතු රු.242,384 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 2014/25 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | තාවකාලික අනියම් (දෛනික) ආදේශක , කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවකයින් බඳවාගැනීමේදී කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය තුල බඳවා ගන්නා ලද සේවකයින් 10 දෙනෙකුට රු.1,547,228 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජුලි 20 දිනැති 02/2011 චක්‍රලේඛය | අනියම්, තාවකාලික, ආදේශක, දෛනික වැටුප් ලබන සියලුම සේවකයින් රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලටදායක කළ යුතු වුවත් සේවා ගිවිසුම් මත බඳවා ගනු ලැබූ සේවකයින් 22 දෙනෙකු සඳහා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා රු.110,310 ක මුදලක් ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,608,013 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.5,519,908 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,127,921 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු.9,127,921 ක වර්ධනයට ආදායම් විෂයයන් 03 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.12.31 දිනට හිඟය<br>2015.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 2,787,771 | 1,828,186 | 5,725,671 | 4,150,722 | 959,585 | 1,574,949 | 2,534,534 |
| ii බදුකුලී | 318,969 | 274,760 | 4,055,058 | 3,957,423 | 44,209 | 97,635 | 141,844 |
| iii බලපත්‍ර ගාස්තු | 102,850 | 17,250 | 477,425 | 477,425 | 85,600 | - | 85,600 |
| ivවෙනත් ආදායම් | 40,795,282 | 12,320,080 | 80,592,652 | 61,412,612 | 28,475,202 | 19,180,040 | 47,655,242 |

2.3.2 බලපත්‍ර ගාස්තු

--------------

සභා බල ප්‍රදේශයේ වෙළඳ ආයතන වලින් 2014 වර්ෂයේ රු. 79,100 ක හිඟ බලපත්‍ර ගාස්තුවක් හා සමාලෝචිත වර්ෂයේ වඩු කර්මාන්ත ශාලා 10 කින් රු.10,000ක වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 වෙනත් ආදායම්

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ත්‍රීරෝද රථගාල් 06 ක ත්‍රීරෝද රථ 100 කින් රු.99,900 ක් හා 2015 වර්ෂයේ ත්‍රීරෝදරථ 196 න් රු.219,300 ක් බැගින් එකතුව රු.319,200 ක හිඟ රථගාල් කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.2,000 ට වඩා වැඩි හිඟයක් පවතින ජල සැපයුම් ස්ථාන 37 කින් රු.276,170 ක හිඟ ජල ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නගරයේ වෙළඳසැල් වල සවිකර තිබූ දැන්වීම් පුවරු 18 කින් අදාල ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් යන්ත්‍ර පැය 47.1 කට රු.117,750 ක් හා පොල්ගස්වත්ත ගම නැගුම ග්‍රාමීය සංවිධානයෙන් යන්ත්‍ර පැය 33.5 කට රු.83,750 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභා බල ප්‍ර දේශයේ සවිකර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 කින් රු.12,000 ක ව්‍යාපාර බදු මුදල් අයකරගෙන නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

(i) උසාවි දඩ රු. 4,540,586
(ii) මුද්දර ගාස්තු රු. 3,185,807

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

(අ) සභා තීරණයක් මත එක් වර්ෂයක් සඳහා පමණක් ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සේවයේ යොදවා ගනු ලැබූ සේවකයින් 11 දෙනෙකුගේ සේවා ගිවිසුම් කාලය ඉකුත් වීමෙන් අනතුරුව වැටුප් හා දීමනා වශයෙන් රු.1,243,809 ක් ගෙවා තිබූ අතර සේවා ගිවිසුම් වලට එළඹීමකින් තොරව සේවකයින් තිදෙනෙකුගේ සේවය වෙනුවෙන් රු.371,637 ක මුදලක් ගෙන තිබුණි.

(ආ) සභාවේ පුස්තකාලයේ පුස්තකාලයාධිපති ගේ 1993 සිට 2014 වර්ෂය දක්වා අනියම් සේවා කාලයට අදාල සේවක අර්ථ සාධක අරමුදලට ගෙවන ලද රු. 105,232 ක් හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවන ලද රු.28,962 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවයේ ස්ථිර කරන ලද සේවකයින් 16 දෙනෙකු සඳහා 2009 නොවැම්බර් මස සිට දෙසැම්බර් දක්වා රු. 106,882 ක් සේවක අර්ථ සාධක අරමුදලට හා රු.26,721 ක් සේවා නියුක්ති භාර අරමුදලට ගෙවා තිබූ අතර එම කාලය සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ද ගෙවා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

ක්ෂේත්‍ර රාජකාරි වල යෙදෙන නිලධාරින්ට ඉදිරි වැඩ සටහන් ගමන යෙදෙන මාසයට පෙර මාසයේදී ආයතන ප්‍රධානියාට ඉදිරිපත් කර අනුමත කරගත යුතු වුවත් එක් ක්ෂේත්‍ර නිලධාරියෙකු 2015 ජුනි මස සිට දෙසැම්බර් දක්වා ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර අනුමත කරගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

(අ) <u>දැරණියගල බස් නැවතුම්පල වැසිකිළි වල ඉදිකිරීම</u>

2014 නොවැම්බර් 25 දින රු.994,145 ක මුදලක් වැය කර දැරණියගල පොදු බස් නැවතුම්පල භූමියේ ඉදිකර තිබූ මුදල් අයකිරීමේ පදනම මත පවත්වාගෙන යන පෞද්ගලික වැසිකිළි දෙකක් බහිස්‍රාවීය ද්‍රව්‍ය එක්රැස් කිරීමට යොදාගෙන තිබූ බව 2016 මැයි 9 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) <u>ලිහිනියාගල රිවර් සයිඩ් වතුනිවාස අසල දිය පැන්නුම වැටි ඉදිකිරීම හා මාර්ගය කොන්ක්‍රීට් කිරීම</u>

ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි විසින් සකස් කළ මිණුම් වාර්තාවේ වැඩ විෂය අංක 6 යටතේ මාර්ගය අඩි 50 ක් දිගින් අඩි 10 ක් පළලින් හා අඟල් 5.33 ක් ඝනකමකින් කොන්ක්‍රීට් යෙදීම සඳහා කොන්ක්‍රීට් කියුබ් 2.21 ක් යොදා ඇති බව දක්වා රු.88,190 ක් (2.21 ×39,905) 2015 දෙසැම්බර් 21 දින ගෙවා තිබුණි. 2016 මැයි 06 දින කර්මාන්තය භෞතික පරික්ෂාවේදී මාර්ගය අඩි 48 ක් (දිය පැන්නුම දෙපස අඩි 24 බැගින් )දිගට අඩි 9.6 ක් පලලට හා අඟල් 5.33 ක් ඝනකමට කොන්ක්‍රීට් කිරීම සිදු කර තිබුණ බව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ක්‍රීට් කියුබ් 2.04 ක වැඩ කොටසක් පමණක් කර තිබූ බැවින් කොන්ක්‍රීට් කියුබ් 0.17 ක් සඳහා රු.6,783 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ඇ) <u>උඩපොල ඇඳගල පාර කොන්ක්‍රීට් කිරීම</u>

සභාවේ කාර්මික නිලධාරිවරයා විසින් සකස් කරන ලද මිණුම් වාර්තාවේ වැඩ විෂය අංක 2 පරිදි 1.2.4 සිමෙන්ති ,වැලි මිශ්‍රණයෙන් මීටර් 48 ක් දිගට මීටර් 2.50 පලලට හා මීටර් 0.125 ක් ඝනකමට මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 15 ක් (48 × 2.5 × 0.125) සඳහා රු.203,880 ක් (15× 13,592) ගෙවීම් කර තිබුණි. 2016 මැයි 06 දින කර්මාන්තය භෞතික පරික්ෂාවේදී මාර්ගය මීටර් 47.1 ක දුරක් පමණක් කොන්ක්‍රීට් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 14.7 ක් (47.1 × 2.5 ×0.125) යොදාගෙන තිබුණි. මේ අනුව කොන්ක්‍රීට් ඝන මීටර් 0.3 ක් සඳහා රු.4,077 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

3.4 වත්කම් කළමනාකරණය
---------------------------

<u>ඌන උපයෝජිත වත්කම්</u>

සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර සූත්‍ර වටිනාකම යටතේ දක්වා තිබූ පහත සඳහන් යන්ත්‍රෝපකරණ භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

| වත්කම් වර්ගය | වටිනාකම<br>රු. |
|---|---|
| තාර බොයිලේරුව | 70,000 |
| කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය | 185,000 |
| කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන යන්ත්‍රය | 168,789 |

3.5 පාරිසරික ගැටළු

-----------------

(අ) සභා බල ප්‍රදේශයේ එක්රැස් කරනු ලබන කැළි කසල හා අපද්‍රව්‍ය ප්‍රති චක්‍රීයකරණය කිරීම හෝ විධිමත්ව බැහැර කිරීමේ ක්‍රම වේදයකින් තොරව, සීතාවක ගඟ ආසන්නයේ පිහිටි සොහොන් බිමෙහි විවෘත ස්ථානයක බැහැර කර තිබුණි.

(ආ) සභාවේ ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින් සපයනු ලබන ජලයේ අහිතකර බැක්ටීරියා අඩංගු බව ආහාර හා ජල දෙපාර්තමේන්තුවේ ජල සාම්පල් පරීක්ෂා වාර්තා මඟින් දක්වා ඇතත් ජලය පිරිසිදු කර ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැය විෂයන් 05 ක එකතුව රු. 105,000 ක ප්‍රතිපාදන 100% ක්ද, වැය විෂයයන් 09 ක එකතුව රු.529,767 ක ප්‍රතිපාදන වලින් 75% ත් 99% ත් අතර ද වශයෙන් එකතුව රු.634,767 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

4.2 පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------

සමාලෝත වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් දෙකකට අදාලව පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ණයහිමි පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) අයවැය පාලනය